# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## සිසුතරණ මාසික පරීක්ෂණ වැඩසටහන - 2019 ජනවාරි

## සිංහල භාෂාව හා සාහිත්‍යය

11 ශ්‍රේණිය

(i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

1. (i) (අ) ජනප්‍රවාදයේ සඳහන් වන ආකාරයට වෑත්තෑවේ හිමියන් ගුත්තිල කාව්‍යය රචනා කිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(ආ) ගුත්තිල පඬිවරයාගේ කීර්තිය පිළිබඳ දැන මූසිල ඔහු සොයා පැමිණියේ කිනම් නගරයට ද?

(ii) (අ) බැද්දේගම නවකතාවේ සිළිඳුගේ දරුවන් දෙදෙනා නම් කරන්න.

(ආ) වනගත පරිසරය ඇසුරින් රචිත, ඒ.පී ගුණරත්න මහතා විසින් සිංහලයට පරිවර්තනය කරන ලද කෘති දෙකක් සඳහන් කරන්න.

(iii) (අ) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් විසින් රචිත මුල් ම කාව්‍ය කෘතිය කුමක් ද?

(ආ) එස්. මහින්ද හිමියන් විසින් කවි පබැඳූ තේමා අතුරින් එකක් නම් කරන්න.

(iv) (අ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත නවකතා දෙකක් ලියන්න.

(ආ) එතුමා රචනා කළ ස්වයං ලිඛිත චරිතාපදානය කුමක් ද ?

(v)

........................................ ................
විදි සත්සර වෙණ සර මදුරෝයා
රැඳි සතොසින්සැනහුණු ඉඳුරෝයා
වැදි දන සිරි ගත්තුය කිඳුරෝයා

(අ) ඉහත පද්‍යයේ පළමු පද්‍ය පාදය සම්පූර්ණ කරන්න.

(ආ) කිඳුරන් වැදි දන සිරි ගත්තේ යයි කියන්නේ ඇයි?

(vi) “මනුෂ්‍යයෝ ඔල්වර හඬ දෙන්නාහු, අත් පොළොසන් දෙන්නාහු, පනන්නාහු ‘වටලා ගතුම්හ‘ යන සමාධියෙන් නටමින්, ගර්ජනා කරමින් සිටගත්හ.

(අ) මෙසේ වටලා ගතුම්හ‘ යි සමාධි ව සිටියෝ කවුරුන් ද?

(ආ) ඉහත උද්ධෘතයේ සඳහන් ශබ්දාලංකාරය කුමක් ද?

(vii) (අ) එච්.එම්. කුඩලිගම කවියා ‘සිංහල ෂෙලි’ ලෙස ප්‍රකට වූයේ කවර හේතුවක් නිසා ද?

(ආ) ඔහුගේ සමකාලීන කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(viii)

අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා
............................................................
............................................................

(අ) ඉහත පද්‍යයේ ඉතිරි දෙපදය ලියන්න.

(ආ) මෙම පද්‍යය අයත් වන්නේ කිනම් ජනකවි ප්‍රභේදයකට ද?

(ix) “ජනාකීර්ණ සමහර ගම් මැදින් බියපත් සිවල් දෙනක මෙන් ඇලළී ඇකිළී යන විට ඇගේ මේ තනිකම ඇට දැනුණේ වඩාත් බලවත් ලෙසිනි.”

(අ) ඉහත පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත අලංකාරය කුමක් ද?

(ආ) මෙම උද්ධෘතය ඇතුළත් කෘතිය නම් කරන්න.

(x) (ඇ) පන්සිය පනස් ජාතක පොත රචනා කරන ලද්දේ කවරෙකුගේ අනුග්‍රහයෙන් ද?
(ආ) පන්සිය පනස් ජාතක පොතේ දීර්ඝතම ජාතක කතාව කුමක් ද?

(ලකුණු 2 x10 =20)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i)
දිය දිය ගොස පළ කරමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි
සිය සිය ගුණයෙන් වෙණ නද නික්මිණි

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) මෙහි සඳහන් පරිදි සිය සිය ගුණයෙන් වෙණ නද නික්මුණේ කාගේ උපදෙස් අනුව කටයුතු කිරීමෙන් ද?

(ii) "බැලුව මැනව දේවයන් වහන්ස, මෙබඳු ඇඹුල මලක් හා මේ සා දිග ඇඹුල දණ්ඩක් දුටු විරූ ද නැත."
(අ) මේ පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.
(ආ) මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) "තව වෙනකන් ඇහැට දැක්කෙ නෑ.එයාගෙ නඩුව් ඇහුවෙ මේ තංගල්ලෙ .මගේ උන මිට තිබුණා. ඔක්කොම ඒ නඩුව වෙනුවෙන් වියදම් කළා."
(අ) ඇහැට දැක්කෙ නෑ යයි මෙහි සඳහන් වන්නේ කවුරුන් පිළිබඳ ව ද?
(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අය ඉන් පසු දැක්වූ ප්‍රතිචාරය කුමක් ද?

(iv)
" මට ද හිමි වේ වංග රාජ්‍යය
ප්‍රබල නරවර පරපුරෙන්
කුමක් දෝ මෙ පාපෙ ලෙනේ මේ විසීමේ සෙතක් දෝ
යන්ට දැන් නම් කාලෙ වේ"

(අ) මෙහි මුල් දෙපදයේ අදහස තනි වාක්‍යයකින් ලිහිල් බසින් ලියන්න.
(ආ) ඉහත උද්ධෘතය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(v)
සැඟවෙමි- එබෙමි- නිසසල වෙමි- සසල වෙමි
ඇඹරෙමි- එහෙත් පසු නොබසිමි- නොනවතිමි
කවදා කොතැනකදි හෝ මහ මුහුදු හිමි
හමුවුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි

(අ) මෙහි සඳහන් රූපකාලංකාරය උපුටා ලියන්න.
(ආ) මෙම පද්‍යය ලියැවී ඇත්තේ කුමන දෘෂ්ටි කෝණයකින් ද?

ලකුණු (4x 5) =20

3. (i).උසස් රස වින්දනයක් හමුවේ සිත් සතන් තුළින් දුර්ගුණ තුරන් ව යන අයුරුත්
(ii)සජීවී ලෙස අවස්ථා හා සිද්ධි නිරූපණය කිරීමත්
ගුත්තිල කාව්‍යයේ වෙණ මිහිරෙහි රසය වඩාත් තීව්‍ර කරයි. එක් කරුණකට නිදසුන් දෙකක් බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි )

4. ප්‍රස්තුතයට උචිත පරිදි චරිත මහෞෂධ පඬිතුමා හා කේවට්ට බමුණු යන චරිත හැසිරවීමට ජාතක කතාකරු පෙන්වූ සමත්කම නිදසුන් තුනක්වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි )